"නිරෝගිකම පරම සැපතයි"

අධ්‍යක්ෂ
பணிப்பாளர்
Director
081 – 2224336

ෆැක්ස්
பகஸ்
Fax
081 – 2204755

මගේ අංකය
எமது இல
My N0. CPC/PDHS/A-6 /4/2025

ඔබේ අංකය
உமது இல
Your No. .....

දිනය
Date 2026-08- 07

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත
காதாரதினைக்களம்- மத்தியமாகானம்
Department of Health Services – Central Province.

ඉතා වැදගත්

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
මහනුවර/ මාතලේ/නුවරඑළිය

වෛද්‍ය අධිකාරි ,දිස්ත්‍රික් මූලික රෝහල
තෙල්දෙණිය/දඹුල්ල/රිකිල්ලගස්කඩ/දික්ඔය

නියෝජ්‍ය අධ්‍යක්ෂ(පුහුණු),
ප්‍රාදේශිය සෞඛ්‍ය පුහුණු මධ්‍යස්ථානය,යටිනුවර

ආයතනභාර වෛද්‍ය නිලධාරි,
පුනරුත්ථාපන රෝහල,දිගන

ජීව වෛද්‍ය ඉංජිනේරු,
ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකය,වටපුලුව

වාර්ෂික ස්ථාන මාරු වීම- 2027

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති මෙම දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරු පරිපාටියෙහි සඳහන් විධිවිධාන අනුව 2027 වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමට තීරණය කරන ලදී. අදාළ පුරප්පාඩු ලේඛන 2026-08-13 දින මෙම දෙපාර්තමේන්තුවේ www.healthdept.cp.gov.lk වෙබ් අඩවියට යොමු කළ අතර, ඒ සම්බන්ධයෙන් අදාළ සියලුම කාර්යය මණ්ඩලය දැනුවත් කර 2027 වර්ෂයේ ස්ථාන මාරු කටයුතු සම්බන්ධයෙන් පහත පරිදි අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස දන්වමි.

02. නිලධාරියා වර්ෂයේ කුමන දිනයක සේවයට වාර්තා කළද එම වර්ෂයේ ජනවාරි 01 දින සිට සේවයට වාර්තා කළා සේ සලකා සේවා කාලය ගණනය කර, වර්තමාන සේවා ස්ථානයේ 2026 -12-31 දිනට වසර 05ක් හෝ වසර 05 ට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති සියලු නිලධාරීන් හා සේවක මහත්ම/මහත්මීන් ස්ථාන මාරු අයදුම්පත් අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය.

03. වාර්ෂික ස්ථානමාරු වලට යටත්ව තාවකාලික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලු නිලධාරීන් 2027 වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

04. 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා ඇති නමුත් අනුප්‍රාප්තිකයකු නොමැතිව හෝ වෙනත් පරිපාලනමය ගැටලුවක් මත ස්ථාන මාරු යාමට නොහැකි වූ නිලධාරීන්ට ද ස්ථාන මාරු නියෝගය ලද ස්ථානයම හෝ තම මනාපය පරිදි වෙනත් ස්ථානයක් ඉල්ලා ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

05. ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් කරන ලද සියලු නිලධාරීන්ගේ අයදුම්පත් එක් එක් තනතුරු අනුව වෙන් වෙන්ව සම්පූර්ණ කර ඇමුණුම 01 අනුව සකස් කරන ලද උපලේඛනය සමඟ ඔබගේ අත්සනින් සහතික කර ඉදිරිපත් කළ යුතුය.එකී උපලේඛනයට නම් ඇතුළත් කිරීමේදී වර්තමාන ශ්‍රේණියට පත්වූ දිනය අනුව ජ්‍යෙෂ්ඨත්වය සැලකිල්ලට ගෙන අනුපිළිවලට සකස් කළ යුතුය.

06. ස්ථාන මාරු අයදුම් කළ යුතු වුවද අයදුම් කර නොමැති සියලු නිලධාරීන්ගේ තොරතුරු ඇමුණුම් 02 අනුව සකස් කරන ලද උපලේඛනය අනුව ඔබගේ අත්සනින් සහතික කර ඉදිරිපත් කළ යුතුය.

07.පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යනු නොලබන සියලු ආයතනවල නිලධාරීන්ගේ ස්ථාන මාරු අයදුම්පත් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව ඉහත උපදෙස් පරිදි මා වෙත යොමු කළ යුතුය.

08. ස්ථාන මාරු වීමට අපේක්ෂා කරන සේවා ස්ථාන නම් කිරීමේදී අවම වශයෙන් සේවා ස්ථාන 10ක් වත් නම් කිරීම (තම මනාපය අනුව) අනිවාර්යය බවත්, තමන් දැනට සේවය කරන සේවා ස්ථානය ස්ථාන මාරු වීමට අපේක්ෂිත සේවා ස්ථානය ලෙස සඳහන් නොකරන ලෙසත්, එය සැළකිල්ලට නොගෙන වත්මන් සේවා ස්ථානය සඳහන් කර ඇති අවස්ථා වලදී සේවා අවශ්‍යතාවය හා පුරප්පාඩු සැළකිල්ලට ගෙන ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි ස්ථාන මාරු කරනු ලබන බවත් දන්වමි. එමෙන්ම අසත්‍ය තොරතුරු ලබා දී ඇති අයවලුන් සඳහාද ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි පුරප්පාඩු පවතින ස්ථාන වලට ස්ථාන මාරු කිරීමට කටයුතු කරනු ලැබේ.

09. එසේම 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව, 2027-01-01 දින සිට ක්‍රියාත්මක කළ යුතු බවට නියෝග ලබා දී ඇති ස්ථාන මාරු ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කළ යුතු වන අතර, එම ස්ථාන මාරු නියෝග ලැබූ නිලධාරීන් 2027 වර්ෂයේ ස්ථාන මාරු සඳහා අයදුම් නොකළ යුතුය.

10. ඉහත උපදෙස් පරිදි සියලුම අයදුම්පත් ඔබගේ පැහැදිලි නිර්දේශ සහිතව උපලේඛනද සමඟ මා වෙත යොමු කළ යුතු වන අතර අදාළ නිලධාරීන් විසින් සෘජුවම මෙම කාර්යාලයට අයදුම්පත් යොමු නොකිරීමට වග බලා ගත යුතුය.

11. තවද මේ සම්බන්ධව නොපමාව ඔබ කොට්ඨාශයේ අදාළ සියලුම නිලධාරීන් හා සේවක මහත්ම/මහත්මීන් දැනුවත් කරන ලෙසත්, ඒ අනුව ඔබ වෙත එවා ඇති ස්ථාන මාරු වීම් පරිපාටියේ සඳහන් උපදෙස් විධිවිධාන පරිදි 2027 වර්ෂයේ ස්ථාන මාරුවීම් අයදුම්පත් සමඟ අදාළ ලියවිලි අනිවාර්යෙන්ම **2026-08-25** දිනට ප්‍රථමව මා වෙත යොමු කිරීමට ඔබගේ පෞද්ගලික අවධානය යොමු කර කටයුතු කළ යුතු බවත් කාරුණිකව දන්වමි.

12. මධ්‍යම පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් වාර්ෂික ස්ථාන මාරුවලට යටත් සියලු තනතුරුවලට අදාළ 2027 වාර්ෂික ස්ථාන මාරු 2027-01-01 දින සිට බලපැවැත්වෙන සේ ක්‍රියාත්මක කිරීමට මෙම දෙපාර්තමේන්තුව විසින් තීරණය කර ඇත. ඒ අනුව, 2027 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක වන දිනය දක්වා සුභද ස්ථාන මාරුවීම් සහ අනෙකුත් අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලීම් හා නිර්දේශ මෙම කාර්යාලය වෙත යොමු නොකරන ලෙස දන්වමි.

වෛද්‍ය කේ.එම්.ජී.කේ.බණ්ඩාර
මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

වෛද්‍ය කේ.එම්.ජී.කේ. බණ්ඩාර
MBBS, Msc, MD (Com.Med) MA (Sociology)
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
මධ්‍යම පළාත

පිටපත්:-

01.මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා, ආණ්ඩුකාර කාර්යාලය - කාරුණික දැන ගැනීම සඳහා
02.ප්‍රධාන ලේකම්, මධ්‍යම පළාත් සභාව - කාරුණික දැන ගැනීම සඳහා
03.ලේකම්,මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කාරුණික දැන ගැනීම සඳහා
04.ලේකම්,මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
05 වෛද්‍ය නිලධාරි (සැලසුම්) - කාරුණික දැන ගැනීම සඳහා
06.විෂය නිලධාරි, A1/A2/A4/A7/ A09/A11/A12/A14/A15/A16/A17/A19A20 - අවශ්‍ය කටයුතු සඳහා

ඇමුණුම 01

අයදුම්පත් ඉදිරිපත් කළ නිලධාරීන්ගේ තොරතුරු
(පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් සඳහා පමණයි)

අනු අංකය	නම	වර්තමාන ශ්‍රේණිය	වර්තමාන ශ්‍රේණියට පත්වූ දිනය	වර්තමාන සේවා ස්ථානය		වර්තමාන සේවා ස්ථානයට පැමිණි දිනය හා එහි සේවා කාලය (2026-12-31 දිනට)		ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කරනු ලබන සේවා ස්ථාන	
				සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය	ක්ෂේත්‍රය	පැමිණි දිනය	එහි සේවා කාලය	සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය	ක්ෂේත්‍රය

සකස් කළේ -
පරීක්ෂා කළේ -

.....
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

ඇමුණුම 01

අයදුම්පත් ඉදිරිපත් කළ නිලධාරීන්ගේ තොරතුරු

තනතුර -

අනු අංකය	නම	ශ්‍රේණිය (උපරිමතම)	වර්තමාන ශ්‍රේණියට පත්වූ දිනය	වර්තමාන සේවා ස්ථානය	වර්තමාන සේවා ස්ථානය පැමිණි දිනය හා එහි සේවා කාලය (2026-12-31 දිනට)		ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කරනු ලබන සේවා ස්ථාන
					පැමිණි දිනය	එහි සේවා කාලය	

සකස් කළේ -
පරීක්ෂා කළේ -

.....
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

ඇමුණුම 02

සුදුසුකම් සපුරා ඇති නමුත් ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් නොකළ නිලධාරින්ගේ තොරතුරු

අනු අංකය	නම	වර්තමාන සේවා ස්ථානය	වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය (2026-12-31 දිනට)	වර්තමාන තනතුර	වර්තමාන තනතුරට පත්වූ දිනය

සකස් කළේ -

පරීක්ෂා කළේ -

.....

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ